# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2265/28 - 2022 පෙබරවාරි මස 01 වැනි අඟහරුවාදා - 2022.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, පුපුරැස්ස අටබාගේ ජල සම්පාදන ව්‍යාපෘතියේ තුම්පැලවක සේවා ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/399.
2022 ජනවාරි මස 31 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

1A - G 35975 — 21 (2022/02)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1140, තුම්පැලවක ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, එරින්වත්ත ගමේ පිහිටි, "එරින්වත්ත" නැමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 10 ක් පමණ වන ඉඩම් කොටස :

මායිම් :

*උතුරට* : පී. ජී. විජේවර්ධන හිමිකම් කියන ඉඩම ;
*නැගෙනහිරට* : පී. ජී. විජේවර්ධන හිමිකම් කියන ඉඩම ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : ඩී. ජී. ජයන්ත කීර්තිසිංහ මයා,
ප්‍රාදේශීය සභා මන්ත්‍රී,
අංක 38,
මොරහේන,
පන්විලතැන්න.

EOG 01 - 0316